**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------------------**

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ආ.ස.බැ) අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාතේ පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,474.59 කට සමාන එජඩො මිලියන 147.45 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් සැපයීමට එජන්ස් ෆ්‍රැන්ෂයිස් ඩි ඩිවලප්මන්ට් (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,569.79 කට සමාන එජඩො මිලියන 23 සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලබා දිය යුතුව තිබිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද පොළී හා බැදීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 173.03 ක් වූ පොළී ගාස්තු සහ 23.39 ක් වූ බැදීම් ගාස්තු | අව ප්‍රමාණය | මහා භාණ්ඩාගාරය විසින් පොළී හා බැදීම් ගාස්තු පිළිබඳ වාර්තා තබා ගනු ලැබේ. | සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපාරයේ සමස්ථ උපයෝජනය නිරූපනය වන පරිදි අදාල වියදම් ගිණුම්වලට ගත යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදනය කරන ලද මෝටර් රථ සිවිල් වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 19.73 | සිවිල් වැඩ වටිනාකම අධි ප්‍රමාණනය වේ. | අදහස් දක්වා නොමැත | ජංගම නොවන වත්කම් වත්කම්වල ආයුකාල පදනම් කොට ගෙන හඳුනාගත යුතුය. |
| (ඇ)වෙනත් ප්‍රදානකරුවෙකු යටතේ මූල්‍යනය වන ව්‍යාපෘතියකින් මාරු කරන ලද මොටර් රථයේ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 8.71 | වත්කම්වල වටිනාකම වාර්තා ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘතිය විසින් ප්‍රයෝජනයට ගන්නා වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

| සංරචක | කාර්යය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත | සත්‍ය | | | |
| ජල සහ සනීපාරක්ෂක යටිතල පහසුකම් වර්ධනය | පූමාලෙ, කරවඩි,නයිනතිවු වල ජල කුළුණු ඉදි කිරීම | ජල කුළුණු 03 | නැත | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමේ සම්භාවිතාවක් තිබීම | | ව්‍යාපෘතියේ පිරිවැය අවම කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| | පූලාලි, කොඩිකාමම්, මීසාලේ, පූන්කරි, පුත්කූර්, නාවත්පුලි වල කරෙයිනගර්හි බෙදාහැරීම් නල එලීම | කි.මී. 230 කි | නැත | එම | 2018 ඔක්තෝම්බර් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. | එම |
| | යාපනය නගර ප්‍රදේශයේ බෙදා හැරීම් නල එලීම. | කි.මී.283 | නැත | එම | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | චුන්නාකම්හි ජල සැපයුම් යෝජනා ක්‍රම ඉදි කිරීම | 2019 අගෝස්තු වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | නැත | එම | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | එම |
| | අපජල පිරිසිදු කිරීමේ පිරියත ඉදි කිරීම හා ප්‍රධාන අප ජල නල එලීම | මෙම කාර්ය යටතේ වැඩ ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණ ළඟා කර ගත නොහැකි වීම. | ණය නියෝජිතානයනය විසින් එම කාර්ය සඳහා කර තිබූ වෙන් කිරීම ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | ප්‍රතිලාභ අපේක්ෂකයන්ට ව්‍යාපෘතියේ ප්‍රතිලාභ නොලැබෙනු ඇත. | |
| යාපනය ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම. | ඉරණමඩු වැවේ ප්‍රධාන කාර්යය ඇතුළු ඉහළ එසවීම් වාරිමාර්ග පුනරුත්ථාපනය, මගින් පහළ ප්‍රදේශවලට ජලය සැපයීම | මෙම සංරචකය යටතේ වූ කාර්යය ආරම්භ කර නොතිබුණි. | | ඉරණ මඩු වැවේ ජලය බෙදා හැරීම සම්බන්ධව ඇති වූ මහජන විරෝධය හේතුවෙන් මෙම සංචරයකය යටතේ වූ කාර්ය ප්‍රමාද වෙමින් පවතී. ජල මූලාශ්‍රය ලෙස මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත (Sea water osmosis plant) ප්‍රතිස්ථාපනය කිරීමට යෝජිතව පවතී. | | දැරීමට සිදු වන අතිරේක පිරිවැය, තාක්ෂණයේ සුලභතාව සහ අපතේ යන කාලය ආදි කරුණු සැලකිල්ලට ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) 2016 වර්ෂයේ ප්‍රදානය කරන ලද ප්‍රධාන පිරිපහදු ජල සම්ප්‍රේෂණ පද්ධතියේ කොටස් අංක 01 සඳහා පයිප්ප සැපයීම හා එලීම කොන්ත්‍රාත්තුව යටතේ 2018 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කිරීමට යෝජිත දුර කි.මී. 42.8 ක් වුවද කි.මී. 35 ක් සඳහා පමණක් පයිප්ප එළීම සම්පූර්ණ කර තිබුණි.තවද, 2016 වර්ෂයේ ප්‍රදානය කරන ලද ප්‍රධාන පිරිපහදු ජල සම්ප්‍රේෂණ පද්ධතිය කොටස් 02 සඳහා පයිප්ප සැපයීම හා එළීම් කොන්ත්‍රාත්තුව යටතේ යෝජිත දුර කි.මී.144 ක් වූව ද කි.මී. 128ක් පයිප්ප එළිම් සම්පූර්ණ කර තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර නිසි භූමීක්ෂණයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය විසින් දුර්වල අධීක්ෂණ යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම නිසා සීමාව ඉක්මවා පිරිවැය ඉහල යා හැක. | පයිප්ප එළීමේ ප්‍රදේශයේ අනපේක්ෂිත හුණු ගල් විහිදුමක් හඳුනා ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස හුණු ගල් කැණීමේ අතිරේක කාර්යය කර ගෙන යාමට සිදු විය. | කාර්යයේ විෂය පථය වෙනස් වීම මත සීමාව ඉක්මවා පිරිවැය ඉහලයාම වැලැක්වීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ජා කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) යාපනය කිලිනොච්චි ප්‍රදේශයට ජලය සැපයීම සඳහා මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත (Sea water osmosis plant) ඉදි කිරීම | උනන්දුවක් දක්වන පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ කාලීනව නොලබෙනු ඇත. | අදහස් දක්වා නොමැත | වෙනත් ව්‍යාපෘතියක් මඟින් ඉරණමඩු වැවේ ධාරිතාව ඉහල නංවා ඇත. ජලය වෙනත් අරමුණක් සඳහා ප්‍රයෝජනයට ගැනීම සලකා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2022 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියතේ කාර්ය නිම කරන තුරු 2018 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කරන පිරිවැය රු.මිලියන 1,140 ක් වූ ජල කුළුණු 15 හි ඉදි කිරීම් සහ පිරිවැය රු.මිලියන 5,536 ක් වූ ජල සම්ප්‍රේෂණ පයිප්ප එළීම් නිශ්කාර්යව පවතී. | | | |
| (ඇ) ව්‍යාපෘතියේ කාර්ය නිම නොවුවද, ණය ආපසු ගෙවීම් 2017 වර්ෂයේ ආරම්භ විය. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යන වාර්තා අනුව, 2018 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායනයට ඩොලර් 164,564 ක ණය ආපසු ගෙවීම් සිදු කර තිබුණි. | කාර්ය නිම කිරීමේ ප්‍රමාදය නිසා අතිරේක පිරිවැය දැරීමට සිදු වී ඇත. | අදහස් දක්වා නොමැත | ණය නියෝජිතායනයෙන් ලද අරමුදල් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම සහතික වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු මෙහෙයවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කලමනාකරණය සම්බන්ධ කරුණු**

| විගණන කරුණු | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට විද්‍යුත් ඉංජිනේරු තනතුර සහ ඉංජිනේරු සහයක තනතුරු 4 ක් පුරප්පාඩුව පැවතුණි. | ව්‍යාපෘතියේ කාර්යය ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපෑම් විය හැක. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යෙදවීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) 2016 මාර්තු 24 දිනැති කලමණාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2016 හි 2.3.2 ඡේදය පරිදි ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක පූර්ණ කාලීනව සේවයේ යෙදවිය යුතුය. කෙසේ වුවද ඉහත සඳහන් විධිවිධානවලට පටහැනිව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උතුරු ප්‍රදේශයේ අතිරේක සාමාන්‍යාධිකාරී ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස රාජකාරී ආවරණය සඳහා 2018 අප්‍රේල් දක්වා පත් කර තිබුණි. | ව්‍යාපෘතියේ කාර්යන්හි අධීක්ෂණ යාන්ත්‍රණය දුර්වල වනු ඇත. | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස පත් කර ඇති ඉංජිනේරුවරය ව්‍යාපෘති කාර්යාලයේ දින 03 ක් සහ සති අන්තයේ රාජකාරී කටයුතුවල නියුතු වේ. | ව්‍යාපෘති කාර්ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ වගකීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ පූර්ණ කාලීනව සේවයේ යෙදිය යුතුය. |